# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1979/20 - 2016 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2016.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2016 ජනවාරි මස 08 වැනි දින අංක 1948/58 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය පිහිටුවන ලැබූ නියමයේ උපලේඛනය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

01. උපලේඛනයේ *I වැනි තීරයේ* ''ශාස්ත්‍ර පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ *II වැනි තීරයේ* ''9. සමාජ විද්‍යා අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන ආදේශ කිරිමෙන් :-

    ''10. බෞද්ධ අධ්‍යයන අංශය''

02. උපලේඛනයේ *I වන තීරයේ* ''වෛද්‍ය පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ *II වන තීරයේ* ''14. ශල්‍ය වෛද්‍ය හා නිර්වින්දන අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

    ''15. වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය

    16. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය

    17. සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය''

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

08 - 652

1A - PG 3046 — 507 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*